# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No ......DSD/HO/5/MF/01/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No ............................................ | දිනය<br>திகதி<br>Date ..2021.02.28.............. |

සමෘද්ධි ප්‍රජාමූල චක්‍රලේඛ 2021/04

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් ,

සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්,

විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන් වෙත.

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති පරිගණක මෘදුකාංගය පිළිබඳ පුහුණුකරුවන්ගේ සේවය ලබා ගැනීම වෙනුවෙන් සංයුක්ත දීමනාව හා ගමන් වියදම ගෙවීම.</u>**

මේ වන විට සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය කරමින් මෘදුකාංගය පිළිබඳව පුහුණුකරු නිලධාරී පිරිසක් තෝරාගෙන ඇත. (A+ හා අනෙකුත්)

02. මෙම නිලධාරීන් සඳහා පළමු අදියරේ පුහුණු සියල්ල අවසන් කර ඇති අතර දෙවන අදියරේ පුහුණුවීම් මේ දින වල සිදු කරමින් පවතී.

03. මෙම නිලධාරීන්ට මෘදුකාංගය පිළිබඳ පුහුණු කිරීමේ මූලික අපේක්ෂාව වූයේ ඔවුන් තම දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි බැංකු මෘදුකාංග ස්ථාපිත කිරීමේ කාර්යයට සෘජුවම දායක කර ගැනීමයි.

04. එසේවුවද, ඔවුන් විසින් එම සේවාව සැපයීමේදී විවිධ සේවාස්ථ ගැටළු මතු වී ඇති බවත්, මෙම සේවා සැපයීමේදී ඔවුන්ගේ ගමන් වියදම් හා අනෙකුත් වියදම් පියවා ගැනීම පෞද්ගලිකව අපහසු වන බැවින්, එම වියදම් පියවා ගැනීමට අවස්ථාවක් සලසා දෙන මෙන් ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණි. මෙම කරුණු සලකා බලා මෙම වියදම් පියවාදීම සඳහා ප්‍රජාමූල බැංකු කළමනාකරණ මණ්ඩලය වෙත පත්‍රිකාවක් ඉදිරිපත් කල අතර, ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත.

"මෙම රාජකාරිය සඳහා අනුයුක්ත කර ඇති නිලධාරියකුට තම දිස්ත්‍රික්කය තුල හෝ ඉන් බාහිර දිස්ත්‍රික්කයක් වෙත තම සේවාව ලබාදීමට සිදුවූ විටක ඒ සඳහා වූ ගමන් වියදම හා නිලධාරියාට හිමි සංයුක්ත දීමනාව එම දිනට අදාලව බැංකුවෙන් හෝ බැංකු සමිතියෙන් ලබා දිය යුතු වේ.ගෙවීම් සිදු කිරීමේදි මේ සම්බන්ධ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළයුතු අතර , සැපයු සේවාව පැය 12ට වඩා වැඩි විය යුතුය.සැපයු සේවාව පැය 12 ට අඩු හෝ පැය 6 ට වැඩි අවස්ථා වලදී සංයුක්ත දීමණාවෙන් ½ ක වටිනාකම සමඟ බස් ගාස්තු දීමනාව ලබා ගත හැකිය.ඒ අනුව පහත උපදෙස් අනුගමනය කරමින් අදාල ගෙවීම් සිදු කිරීමට කටයුතු කරන්න."


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

I. සේවා සපයන පුහුණු නිළධාරියා තම සේවාව සපයන බැංකුවේ බැංකු කළමණාකරු විසින් ලිඛිතව කරන ලද ඉල්ලීම් සමඟ රාජකාරි නිවාඩු ඉල්ලුම් පත්‍රය ආයතන ප්‍රධානියා /බලය ලත් නිළධාරියා වෙත යොමු කර රාජකාරි නිවාඩු අනුමත කරගත යුතුය.

II. බැංකුව හා බැංකු සමිතිය විසින් අදාල සේවාව සපයන නිළධාරියාගේ පැමිණිම , ඉටුකල රාජකාරිය හා පිටවූ වේලාව සටහන් කිරීමට වෙනම සටහන් පොතක් පවත්වාගෙන යාම හා සේවය සපයන නිලධාරියා එම බැංකුවට පැමිණි වේලාව, පිටවූ වේලාව හා සිදුකල කාර්යය සටහන් කර කළමනාකරු විසින් සහතික කිරීමක් සිදුකළ යුතුය.

III. යම් නිලධාරියකු තමා සේවය කරනු ලබන කොට්ඨාශයේ හෝ ඉන් බැහැර යන්නේ නම් එදිනට අදාල සේවය ලබාදිය යුතු බැංකුව හෝ බැංකු සමිතිය වෙත වාර්තා කර තම සේවාව ඉටු කර දිය හැකි අතර ,එම බැංකුව අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම අවශ්‍ය නොවේ.

IV. සේවාව සපයන නිළධාරි විසින් පොදු 177 නිසි පරිදි සම්පූර්ණ කර ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අදාල බැංකු /බැංකු සමිතිය වෙත ඉදිරිපත් කර අදාල දීමනාවන් ලබා ගත යුතුය.බැංකු හා බැංකු සමිති කළමණාකරුට මෙම උපදෙස් සහ චක්‍රලේඛ උපදෙස් අනුව දීමනාව ලබා දිය හැකි අතර, ඉල්ලීම පරිදි දීමනාව අදාල මුදලට සමාන චෙක්පතකින්ද නිකුත් කර හැකිය.එසේ වියදම් දැරීමෙන් පසුව පාලක මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගත යුතුය.

05 සමෘද්ධිකාංගය ස්ථාපිත කිරීමේදි ,පුහුණු නිලධාරීන්ගේ සේවය කාර්යක්ෂමව ලබා ගැනීම සඳහා , ඉහත වියදම් සේවාව ලබා ගත් බැංකු වෙන් දැරීම සඳහා උපදෙස් නිකුත් කරන අතර , වියදම් දැරීමේදි ,බැංකු විසින් (කේත අංක 2140) වැය ශිර්ෂය පරිගණක නඩත්තු ,උපාංග මිලදී ගැනීම් හා සේවා ගාස්තු ශිර්ෂයට හර කළ යුතු අතර, බැංකු සමිති විසින් (කේත අංක 6307) වැය ශිර්ෂය පරිගණක නඩත්තු, උපාංග මිලදී ගැනීම් හා සේවා ගාස්තු ශිර්ෂයට හර කළ යුතුය

06. මෙම උපදෙස් 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන අතර, යම් නිලධාරියකු දැනටමත් ඉහත උපදෙස් පරිදි කටයුතු කර ඇති විටකද, මෙම දීමනාව ලබාදිමට බලය ඇත.

ඉහත උපදෙස් පිළිපදිමින් අදාල කාර්යය සාර්ථක කර ගැනීමට කටයුතු කරන මෙන් දන්වමි.

ආර්.පී.බී තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
4. අධ්‍යක්ෂ- ක්ෂුද්‍රමූල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
5. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස. සහ අ.ක.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
7. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.